2024.12.20. මව්බිම පිටු 1, 2

# හිසට වහලක් නැති අය සොයා සංගණන නිලධාරීන් මහ රෑ මහ පාරට

▶2 පිටුවට

**රවිශාන් පුනාන්දු**

හිසට වහලක් නොමැති පුද්ගලයන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ කටයුතු පසුගිය 18 වැනිදා රාත්‍රී කාලයේදී සිදු කළ බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය 'මව්බිම'ට පැවැසුවාය.

## හිසට වහලක් නැති...

එම පුද්ගලයන් පදික වේදිකාවේම දිවි ගෙවන පිරිස්ද යන බව සොයා ගැනීමට හැක්කේ රාත්‍රී කාලයේදී බැවින් එදින රාත්‍රී 10.00 සිට මධ්‍යම රාත්‍රී 12.00දක්වා කාලයේදී එම තොරතුරු එක් රැස් කර ගත් බව ප්‍රකාශ කළාය.

හිසට වහලක් නොමැති වුවද රටේ ජනගහනයට අයිති බැවින් සෑම සංගණයකදීම ඔවුන්ගේ තොරතුරුද එකතු කරගන්නා බව ඇය අවධාරණය කළාය.

එම පිරිස් එක් තැනක රැඳී නොසිටින බැවින් තොරතුරු රැස්කර ගත්පසු ඒ සෑම කෙනෙක් වෙතටම තොරතුරු ලබා ගත් බවට කාඩ්පතක් නිකුත් කළ බව සෙනෙවිරත්න මහත්මිය කීවාය.

මේ අතර මෙම ක්‍රියාවලිය සිදුකිරීම සඳහා පොලිස්පතිතුමා හරහා සියලු පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත්කර පොලිස් නිලධාරීන්ගේද සහාය ලබාගත් බව ඇය කීවාය.

ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් එවැනි හිසට වහලක් නොමැති පුද්ගලයන් සිටිනා වූ ස්ථාන පිළිබඳ තොරතුරු කල් ඇතුව එකතු කර තිබුණු බවත් ඒ අනුව ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්ත එකතු කර ගැනීමේදී වඩාත් පහසු වූ බවද ඇය කීවාය.

දිවයින පුරාම එකම වේලාවක් තුළ එම කටයුතු සාර්ථකව අවසන් කළ බව ඇය ප්‍රකාශ කළාය.

මේ අතර ජන හා නිවාස සංගණනයේ මූලික වාර්තාව ජනවාරි මාසයේදී නිකුත් කිරීමට බලාපොරොත්තු වන බව අධ්‍යක්ෂ ජනරාල්වරිය ප්‍රකාශ කළාය.

ටැබ්ලට් පරිගණක සහ ජංගම දුරකථන භාවිතයෙන් ක්ෂේත්‍ර රාජකාරිවලදී ලබා ගන්නා ලද තොරතුරු යාවත්කාලීන කර මූලික වාර්තාව එළිදක්වන බව සෙනෙවිරත්න මහත්මිය පැවසුවාය.

ජන හා නිවාස සංගණනයේ කටයුතු ඊයේ (19දා) මධ්‍යම රාත්‍රියෙන් අවසන් කළ බව ඇය කීවාය.

ඔක්තෝබර් 07 වැනි දින සිට ජන හා නිවාස සංගණනයේ පුද්ගලයන්ගේ සහ නිවාසවල තොරතුරු රැස්කිරීමේ කටයුතු ආරම්භ කළ බව ඇය සඳහන් කළාය.

මේ දක්වා තොරතුරු ලබාගැනීම සඳහා නිවෙස් වෙත සංගණන නිලධාරීන් පැමිණ නොමැති නම් ඒ පිළිබඳව 1901 කෙටි දුරකථන අංකය ඔස්සේ දැනුම්දෙන ලෙසද අධ්‍යක්ෂ ජනරාල්වරිය ජනතාවගෙන් ඉල්ලීමක් කළාය.

ජනතාවගේ තොරතුරු කිසිදු වෙනත් පාර්ශ්වයකට පෞද්ගලිකත්වය අනාවරණය වන ලෙස පත් නොකිරීමට සිය දෙපාර්තමේන්තුව ප්‍රතිඥා දී ඇති බව සෙනෙවිරත්න මහත්මිය වැඩිදුරටත් සඳහන් කළාය.